සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

# චිත්‍ර කලාව

06 ශ්‍රේණිය | කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.

---

## I කොටස

- පහත දැක්වෙන ඡායාරූපය ඇසුරුකරගෙන ප්‍රශ්න අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.




01 ඉහත රූප සටහනෙන් දැක්වෙන්නේ ........................................................ ක්‍රමයේ දේවස්ථානයයි.

02 A අක්ෂරයෙන් දැක්වෙන්නේ ................................................................ යි.

03 B අක්ෂරයෙන් ........................................................ දැක්වෙයි.

04 මෙම රූපයේ දැක්වෙන දේවස්ථානවලට අමතරව උල් වූ තුඩු සහිත ආරුක්කු සහිත දොර ජනෙල් ............................................................ දේවස්ථාන තුළ දැකිය හැක.

05 ශ්‍රී ලංකාවේ ප්‍රධාන කිතු දේවස්ථාන අතුරින් එකක් ලෙස බොරැල්ලේ ........................................................ දේවස්ථානය විශේෂ වේ.

- **පහත දැක්වෙන වචනවලට වඩාත් සම්බන්ධතාවයක් දැක්වෙන වචනය වරහන තුළින් තෝරා ඉදිරියේ ඇති තිත් ඉරි මත ලියන්න.**

(රාමසාන් උත්සවය / හින්දු කෝවිල / තෛපොංගල් උත්සවය / බෝධි පූජා / ජේසු බිළිඳා / කුම්බා)

06 නන්දි ගවයා ..............................

07 තෙමගුල ..............................

08 බෙත්ලෙහෙම ..............................

09 කුර්ආනය ..............................

10 කෝලම් රටා ..............................

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා දී ඇති වාක්‍ය හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වාක්‍ය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

11 විවිධ මාධ්‍ය / ද්‍රව්‍ය එකලස් කිරීමෙන් මූර්තියක් නිර්මාණය කළ හැක. ( )

12 'සකාත්' යන අනිවාර්ය නොවන දානය ද 'සදකා' යන අනිවාර්ය දානය ද මුස්ලිම්වරු විසින් දෙනු ලැබේ. ( )

13 'නතාල' නැමති පෘතුගීසි වචනයෙන් බිඳී ආ නත්තල යන වචනයෙන් 'උපත' යන අර්ථය ලබාදේ. ( )

14 සිදුරු තහඩු මුද්‍රණයේ දි දියසායම් භාවිතය නුසුදුසු ය. ( )

15 හින්දු කෝවිලක ප්‍රධානම ගෘහ නිර්මාණ අංගය වන්නේ එහි පිවිසුම් දොරටුව වන 'ගෝපුරම්' හෙවත් ගෝපුරයයි. ( )

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

16 කොලාජ් චිත්‍රයක් යනුවෙන් අදහස් කරන්නේ,

(1) නිදහසේ කොළ ඉරා අලවනු ලබන චිත්‍රවලට ය.

(2) මූලික රූප රේඛාවෙන් ඇඳ පසුව කොළ ඉරා ඇලවීමය.

(3) යම්කිසි හැඩයකට කොළ කපා ඇලවීමය.

(4) රෙදි කැබලි, කඩදාසි ආදිය මිශ්‍ර කර ඇලවීමය.

17 පංති කාමරයේ දී ඔබ ද්‍රව්‍ය බලා ඇඳීමකදී කළ යුතු නිවැරදි කටයුත්තක් වන්නේ,

(1) අඩිරූල්, කවකටු ආධාරයෙන් නිවැරදිව රේඛා සටහන් ඇඳීමය.

(2) අවශ්‍ය රේඛා සටහන් පැන්සල ආධාර කරගෙන නිවැරදිව ඇඳීමය.

(3) යෝජිත ද්‍රව්‍ය වටේම කළු රේඛාවකින් ඇඳ ද්‍රව්‍ය මතු කිරීමය.

(4) දී ඇති ද්‍රව්‍යවල ඇති වර්ණම යොදා නොගැනිමය.

18 මූලික වර්ණ 3 වන්නේ,

(1) නිල්. දම්, රතු (2) නිල්, කහ, රතු

(3) තැඹිලි, දම්, කොළ (4) රතු, සුදු, කළු

19 ළමා පොත් පිටකවරයක් පිළිබඳව දී ඇති වාක්‍යවලින් අදාළ නොවන වාක්‍ය වන්නේ,

(1) ළමා පොත් පිටකවර නිර්මාණ ග්‍රැෆික් චිත්‍රවලට අයත් වේ.

(2) ළමා පොත් පිටකවර නිර්මාණයේ දී මුල් හා පසු කවරය පිළිබඳවද සැලකිලිමත් විය යුතුය.

(3) ළමා පොත් පිටකවර නිර්මාණයේදී මුල් පිටුව පමණක් නිර්මාණය කිරීම නිවැරදිය.

(4) ළමා පොත් පිටකවර නිර්මාණයේදී ළමා මනසට උචිත වර්ණ හැඩතල හා අකුරු යොදාගත යුතුය.

20 පංති කාමරයේදි ඔබ ඇඹීම සඳහා යොදාගන්නා පහසුම මාධ්‍යය වන්නේ,

(1) මැටි මාධ්‍යයයි. (2) සිමෙන්ති මාධ්‍යයයි.

(3) ප්ලාස්ටර් ඔෆ් පැරිස් මාධ්‍යයයි. (4) හුණු බදාමයයි.

## II කොටස

- **ඔබේ නම / විභාග අංකය හා තෝරාගත් මාතෘකාව චිත්‍රය පසුපිටේ සඳහන් කරන්න.**
- **දී ඇති මාතෘකාවලින් එකක් තෝරාගෙන වර්ණ චිත්‍රයක් අඳින්න.**
- **ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.**

---

01 ආගමික වතාවත්වල යෙදෙන බැතිමතුන්

02 අම්මා මල්ලීට බත් කවපු හැටි

03 මුව රංචුවක් විලක දිය බොන ආකාරය

04 මලයි සමනලයයි සහිතව චීත්ත රෙද්දකට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක්

05 කාටූන් රූප ඇසුරෙන් ළමා ඇඳ ඇතිරිල්ලකට (බෙඩ්ෂීට්) සුදුසු මෝස්තරයක්

06 ''අලි හාමි'' නැමති ළමා කතන්දර පොතට ගැලපෙන මුල් කවරයක් අඳින්න.

(ලකුණු 60 යි)

**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | රෝමන් | 02 | වෘත්තාකාර කවුළුවයි | 03 | බොකු වහල සහිත ආරුක්කු | | |
| 04 | ගොතික් ක්‍රමයේ | 05 | සියලු සාන්තුවරුන්ගේ | 06 | හින්දු කෝවිල | 07 | බෝධිපූජා |
| 08 | ජේසු බිළිඳා | 09 | රාමසාන් උත්සවය | 10 | තෛපොංගල් උත්සවය | | |
| 11 | ✓ | 12 | ✗ | 13 | ✓ | 14 | ✗ |
| 15 | ✓ | | | | | | |

16 නිදහසේ කඩදාසි කොළ ඉරා අලවනු ලබන චිත්‍රවලට ය. - (1)

17 අවශ්‍ය රේඛා සටහන් පැන්සල ආධාර කරගෙන නිවැරදිව ඇඳීමය - (2)

18 නිල්, කහ, රතු - (2)

19 ළමා පොත් පිටකවර නිර්මාණයේදි මුල් පිටුව පමණක් නිර්මාණය කිරීම නිවැරදිය. - (3)

20 මැටි මාධ්‍යයයි. - (1) (2 x 20 = 40)

I කොටසට ලකුණු 40 යි. II කොටසට ලකුණු 60 යි. මුළු ලකුණු 100 යි.